# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## ජලනල නඩත්තුකරු [Plumber] (කාන්තා / පුරුෂ)

**කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමනාකරණ කාර්යාලයේ පවතින ජලනල නඩත්තුකරු (ජලනල කාර්මික ශිල්පී) තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් / කාර්ණියන් බඳවා ගැනේ.**

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු.**
**ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

තානාපති කාර්යාලයේ පරිශ්‍ර කළමනාකරණ අංශයට අනුබද්ධව සේවය කරන ජලනල නඩත්තුකරු විසින් තානාපති කාර්යාලයට අයත් නේවාසික හිමිකාරිත්වය / කල්බදු අයිතිය සහිත දේපළ ඇතුළු ගොඩනැගිලි සහ පරිශ්‍ර වල සැලසුම් කළ හා නොකළ නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සිදුකල යුතුය. එසේම ඔහු / ඇය විසින් ගොඩනැගිලි හා කාර්මික පද්ධති, බීමට යෝග්‍ය ජලය පිරියම් කිරීමේ සහ ගබඩා කිරීමේ පද්ධති, අපජලය පිරියම් කිරීමේ පද්ධති, ගිනි නිවීම සඳහා වූ ජල ඉසින, පිහිනුම් තටාක හා භූමි වාරිමාර්ග පද්ධති ඇතුළු, නමුත් සීමා නොවූ, පද්ධතීන් රැසකට ආධාර වන ජලනල සවි කිරීම සහ අලුත්වැඩියා කිරීම සිදුකල යුතුය.

**පූර්ණ කාලීනව සතියකට පැය 40 ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප රු. 82,050/- කි.**

**අවශ්‍ය සුදුසුකම් :**

1 **අධ්‍යාපනය** - ද්විතියික අධ්‍යාපනය *(අ.පො.ස. සාමාන්‍ය පෙළ පරීක්ෂණය සඳහා ගණිතය විෂයය ඇතුළුව විෂයයන් හයක් (6) සමත්ව තිබිය යුතු අතර, අවම වශයෙන් විෂයයන් තුනක් (3) සඳහා විශිෂ්ට සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.)* සම්පූර්ණ කර තිබිය යුතු අතර ජලනල කාර්මික ශිල්පයේ සිද්ධාන්ත සමඟ පුහුණු ශිල්පී මට්ටමේ කාර්මිකයින් පුහුණු කරවන පිළිගත් අධ්‍යාපන ආයතනයක වෘත්තීය පුහුණුව සම්පූර්ණ කළ යුතුය. **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

2 **පූර්ව රැකියා පළපුරුද්ද** - ගොඩනැගිලි සහ කාර්මික ජලනල පද්ධති, උපයෝගිතා පිරියම් කිරීමේ මෙහෙයුම් නඩත්තුව සහ අලුත්වැඩියාව පිළිබඳ අවම වශයෙන් වසර තුනක (3) පළපුරුද්ද තිබිය යුතුය. **(අදාළ සේවා / ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

3 **භාෂා ප්‍රවීණතාවය** - **II** වන මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ **(මෙය පරීක්ෂා කරනු ලැබේ).**
එසේම **III** වන මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) සිංහල සහ / හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4 **නිපුණතා සහ හැකියාවන්** - පරිශීලකයන් විසින් යොමු කරන විමසීම් සඳහා පිළිතුරු සැපයීමට හැකිවන පරිදි මනා සන්නිවේදන සහ අන්තර්පුද්ගල කුසලතාවන් තිබිය යුතුය. එමෙන්ම, කණ්ඩායමක් ලෙස වැඩ කිරීම, පීඩනය යටතේ සහ දැඩි කාල සටහන් යටතේ සේවය කිරීමට හැකිවිය යුතුය. ඕනෑම වැඩමුරයකට වාර්තා කිරීමේ සහ දවසේ ඕනෑම වේලාවක සිදුකරන හදිසි කැඳවීම් වලට වාර්තා කිරීමේ නම්‍යශීලීභාවයක් තිබිය යුතුය. මනා රිය ධාවන වාර්තාවක් සහිතව **"B"** පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් **'C','C1'** කාණ්ඩ) තිබිය යුතුය. **(සුරක්ෂිතව රිය පැදවීමේ හැකියාව පරීක්ෂා කෙරෙනු ඇත) රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතුය.**

**අයදුම් කරන ආකාරය :**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවාගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**අවශ්‍ය ලේඛන :**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාල අධ්‍යාපන සහතික
- අදාල සේවා / කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- රියදුරු බලපත්‍රය (පැති දෙකම සහිත)
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම් පත / විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

**තැපැල් හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2021 **අගෝස්තු** 04 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සළස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.